# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 5 ශ්‍රේණිය - පරිසරය ( සැප්තැම්බර් -3 සතිය )

## 12 තේමාව - මිනිස් හැසිරීම්

❖ ක්‍රියාකාරකම 1

පුතාලා දන්නවද "රටවටකර වැට බැන්දත් කට වටකර වැට බඳින්න බෑ" යනුවෙන් කියමනක් අතීතයේ දී භාවිතා කළේ කට පාලනය කර ගැනීමට නොහැකි අය සම්බන්ධයෙන් ය. නිවසේ අය සමඟ එකතු වී මේ කියමන භාවිතා කිරීම පිළිබඳව තොරතුරු අසා පැහැදිලි කරන්න.

❖ ක්‍රියාකාරකම 2.

මහනෙල් සුවඳ මය - කුඩ මසු පිළී ගඳමය<br>
දෙකට එක දියමය - හොඳට නරකට දෙකට කටමය

දුවේ පුතේ, මේ කවිය කිහිපවරක් කියවන්න. මේ කවියේ තේරුම වැඩිහිටියන්ගෙන් අසා දැනගන්න.

(හොඳින් සිතා බලා කට පාවිච්චි කිරීමේ වටිනාකම මින් පැහැදිලි වේ).

❖ ක්‍රියාකාරකම 3.

- සිනාසී "ආයුබෝවන්" කියන සිසුන් දෙදෙනෙකුගේ චිත්‍රයක් අඳින්න.
- මිනිස් සමාජයේ කටයුතු කිරීමේ දී අපි විසින් ඇති කරගත යුතු හොඳ ගුණධර්ම 5ක් ලියන්න.

❖ E nanapiyasa 5 ශ්‍රේණිය පරිසරය -12 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.